# කිතුල් සංවර්ධන මණ්ඩලය

## වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

## තනතුරු පුරප්පාඩු - කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

**කිතුල් සංවර්ධන මණ්ඩලයෙහි පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| | |
|---|---|
| 01. සාමාන්‍යාධිකාරි (HM 2-1) | - තනතුරු 01 |
| 02. කළමනාකරු (HM 1-1) | - තනතුරු 01 |
| 03. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (පර්යේෂණ) (MM 1-1) | - තනතුරු 01 |
| 04. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (පාලන) (MM 1-1) | - තනතුරු 01 |
| 05. පරිපාලන නිලධාරි (JM 1-1) | - තනතුරු 01 |
| 06. ගිණුම් නිලධාරි (JM 1-1) | - තනතුරු 01 |
| 07. පර්යේෂණ හා සංවර්ධන නිලධාරි (JM 1-1) | - තනතුරු 02 |
| 08. පර්යේෂණ හා සංවර්ධන සහකාර (MA 1-1) | - තනතුරු 05 |

## 01. සාමාන්‍යාධිකාරි ( HM 2-1) - තනතුරු 01

සුදුසුකම් හා පළපුරුද්ද

- **බාහිර අයදුම්කරුවන් සඳහා**

(අ) විද්‍යාව (විෂය ක්ෂේත්‍රයට අදාළව) / කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ මූල්‍යකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමඟ

විද්‍යාව (විෂය ක්ෂේත්‍රයට අදාළව) / කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ මූල්‍යකරණ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක ,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 5 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) විද්‍යාව (විෂය ක්ෂේත්‍රයට අදාළව) / කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ මූල්‍යකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමඟ

විද්‍යාව (විෂය ක්ෂේත්‍රයට අදාළව) / කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ මූල්‍යකරණ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධිය ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක ,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර පහක (05) ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද

- **අභ්‍යන්තර අයදුම්කරුවන්**

කිතුල් සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයේ වසර පහක (05) අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමඟ

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාව

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | HM 2-1 |
| **වැටුප** | - | **රු. 140,317 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව 2026.01.01 දිනට වැටුප)** |
| **වයස** | - | **අවු. 35 ට නොඅඩු හා අවු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.** |
| **බඳවා ගැනීමේ ක්‍රමවේදය** | - | **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ.** |

## 02. කළමනාකරු (HM 1-1) - තනතුරු 01

සුදුසුකම් හා පළපුරුද්ද

- **බාහිර අයදුම්කරුවන් සඳහා**

(අ) විද්‍යාව (විෂය ක්ෂේත්‍රයට අදාළව) / කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ මූල්‍යකරණ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමඟ

විද්‍යාව (විෂය ක්ෂේත්‍රයට අදාළව) / කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ මූල්‍යකරණ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ ඉහත විෂය ක්ෂේත්‍රයන්ට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක , මණ්ඩලයක , ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. කළමනාකාර සේවා (MM) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (05) අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | - | **HM – 1-1 2026** |
| වැටුප අනුව | - | **රු. 123,019.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 2026.01.01 දිනට වැටුප)** |
| වයස | - | **අවු. 35 ට නොඅඩු හා අවු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.** |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | - | **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.** |

## 03. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (පාලන) (MM 1-1) - තනතුරු 01

සුදුසුකම් හා පළපුරුද්ද

- බාහිර අයදුම්කරුවන් සඳහා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් උපාධිය ලබා තිබීම.

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ , රාජ්‍ය සංස්ථාවක , මණ්ඩලයක , ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති කිතුල් සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතුවූවකු වීම.

හෝ

II. 'කණිෂ්ඨ කළමනාකාර' JM සේවා ගණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | - | **MM – 1-1 2026** |
| **වැටුප** | - | **රු. 81,710.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව 2026.01.01 දිනට වැටුප)** |
| **වයස** | - | **අවු. 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.** |
| **බඳවා ගැනීමේ ක්‍රමවේදය** | - | **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ.** |

## 04. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (පර්යේෂණ) (MM 1-1) - තනතුරු 01

සුදුසුකම් හා පළපුරුද්ද

- බාහිර අයදුම්කරුවන් සඳහා

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව විෂය ක්ෂේත්‍රයට අදාලව කෘෂිකර්මය විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා ඇති කිතුල් සංවර්ධන මණ්ඩලයේ සේවයේ නියුතු වූවකු වීම.

හෝ

II. 'කණිෂ්ඨ කළමනාකාර' JM සේවා ගණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | - | **MM – 1-1 2026** |
| වැටුප | - | **රු. 81,710.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව 2026.01.01 දිනට වැටුප)** |
| වයස | - | **අවු. 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.** |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | - | **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ.** |

## 05. පරිපාලන නිලධාරි (JM 1-1) - තනතුරු 01

සුදුසුකම් හා පළපුරුද්ද

- බාහිර අයදුම්කරුවන් සඳහා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / ව්‍යාපාර පරිපාලන හෝ කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර 'තාක්ෂණික නොවන' (MA 1) සේවා ගණයන්හි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | - | **JM – 1-1 2026** |
| වයස | - | **අවු. 22 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.** |
| වැටුප අනුව | - | **රු. 65,633.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 2026.01.01 දිනට වැටුප)** |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | - | **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.** |

## **06.** ගිණුම් නිලධාරී (JM 1-1) **- තනතුරු 01**

සුදුසුකම් හා පළපුරුද්ද

- බාහිර අයදුම්කරුවන් සඳහා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍යකරණ/ ගණකාධිකරණ / ව්‍යාපාර පරිපාලන හෝ කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර 'තාක්ෂණික නොවන' (MA 1) සේවා ගණයන්හි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | - | **JM – 1-1 2026** |
| වයස | - | අවු. **22** ට නොඅඩු හා අවු **45** ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ. |
| වැටුප | - | රු. **65,633.00** (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක **01/2025** අනුව **2026.01.01** දිනට වැටුප) |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | - | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ. |

## 07. පර්යේෂණ හා සංවර්ධන නිලධාරි (JM 1-1) - තනතුරු 02

සුදුසුකම් හා පළපුරුද්ද

- බාහිර අයදුම්කරුවන් සඳහා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව (විෂය ක්ෂේත්‍රයට අදාළව)/ කෘෂිකර්මය/ ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1) සේවා ගණයන්හි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | - | **JM – 1-1 2026** |
| වයස | - | අවු. **22** ට නොඅඩු හා අවු **45** ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ. |
| වැටුප | - | රු. **65,633.00** (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක **01/2025** අනුව **2026.01.01** දිනට වැටුප) |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | - | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ. |

## **08.** පර්යේෂණ හා සංවර්ධන සහකාර (MA 1-1) - තනතුරු 05

සුදුසුකම් හා පළපුරුද්ද

- බාහිර අයදුම්කරුවන් සඳහා

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල / දෙමළ භාෂාව
ii. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂයධාරාවෙන් හෝ කෘෂිකර්ම විෂය සහිතව අවම වශයෙන් විෂයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂනය හැර) සමත්වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් හතරක් (04) සමත් වී තිබීම අවශ්‍ය වේ.)

- අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන , අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත (ආ), (ඇ), සහ (ඉ) හි සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

I. සිංහල / දෙමළ භාෂාව
II. ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු පහක (05) ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

සටහන : (යම් තනතුරකට ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත “ඉ”) ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාළ පරිච්ඡේද ඉහත “ඉ” ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

වැටුප් කාණ්ඩය - **MA – 1-1 2026**

වයස - **අවු. 18 ට නොඅඩු හා අවු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.**

වැටුප - **රු. 43,312.00 (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව 2026.01.01 දිනට වැටුප)**

බඳවා ගැනීමේ ක්‍රමවේදය - **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ.**

- වෙනත් කොන්දේසි :

ඉහතින් සඳහන් කර ඇති සුදුසුකම් වලට අමතරව සෑම තනතුරක් සඳහාම ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්තවිය යුතුය.

අයදුම්පත්,

- ජීව දත්ත හා තනතුර සඳහා ඉල්ලා ඇති අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් විස්තර ඇතුලත්කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ /සංස්ථා/මණ්ඩල වල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානින් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කළ යුතුය.
- ඔබ විසින් අයදුම් කරනු ලබන එක් එක් තනතුරු සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර ඉල්ලුම් කරන තනතුරු පැහැදිලිව අයදුම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

  (මේ සමඟ ඇති කිතුල් සංවර්ධන මණ්ඩලය සඳහා කණිෂ්ඨ කළමනාකරණ (JM) සහ කළමනාකරණ සේවා (MM) ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය හා කිතුල් සංවර්ධන මණ්ඩලය සඳහා මාණ්ඩලික නොවන සේවා ගණයන්හි තනතුරු සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය භාවිතා කරන්න.)

  සියලුම ඉල්ලුම්පත් 2026.08.12 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති , කිතුල් සංවර්ධන මණ්ඩලය , නො. 45 , ශාන්ත මයිකල් පාර , කොළඹ 03 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

- ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

  මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික බලපෑම් ඒ සඳහා නුසුදුසු කමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

- අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සභාපති,
කිතුල් සංවර්ධන මණ්ඩලය,
නො.45,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.